# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
## மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை

1 වන මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට. 1ஆம் மாடி, மாகம் ருஹுனுபுர நிர்வாக கட்டிடத் தொகுதி, சிறிபோபுர, ஹம்பாந்தோட்டை
1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

"සෞභාග්‍යයේ දැක්ම" "செழிப்பான எதிர்காலத்திற்கு" "For a prosperous future"


මගේ අංකය / எனது இலக்கம் / My No } DSH/DPS/07/DCC/වාර්තා/2025 ඔබේ අංකය / உமது இலக்கம் / You're No }

දිනය / திகதி / Date } 2025.12. 29

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - *2025.12.17*</u>**

*2025.12.17* වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යයන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතනවල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථාවලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03. එසේම, මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය මා වෙත *DCC Hambantota WhatsApp* වෙත හෝ *dpshambantota@gmail .com* වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04. තවද, මෙම වාර්තාව *www.hambantota.dist.gov.lk* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

පිටපත්:-
01. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා - කරු.දැ.ගැ.ස
02. ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
03. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස.


| | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / District Secretary – 047 2256235 | අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන) / மேலதிக மாவட்ட செயலாளர் (நிர்வாகம்) / Additional District Secretary (Admin) – 047 2256232 | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) / மேலதிக மாவட்ட செயலாளர் (காணி) / Additional District Secretary (Land) – 047 2256002 | ප්‍රධාන ගණකාධිකාරී / கணக்காளர் / Chief Accountant – 047 2256246 |
| අධ්‍යක්ෂ (කෘෂිකර්ම) / பணிப்பாளர் (விவசாயம்) / Director (Agriculture) – 047 3628890 | අධ්‍යක්ෂ (සැලසුම්) / பணிப்பாளர் (திட்டமிடல்) / Director (Planning) – 047 2256234 | සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மாவட்ட செயலாளர் / Assistant District Secretary – 047 2256945 | පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer – 047 2256285 |
| කාර්යාලය / அலுவலகம் / Office | ෆැක්ස් / தொலைநகல் / Fax – 047 2256235, 047 2256247 | ඊ මේල් / மின்னஞ்சல் / email : moha.dist.hambantota@gmail.com; වෙබ් අඩවිය / இணையத்தளம் / Web site : www.hambantota.dist.gov.lk | |


CamScanner

## හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම - 2025.12.17

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා පළාත් සභා හා පළාත් පාලන ගරු නියෝජ්‍ය අමාත්‍ය පී. රුවන් සෙනරත් මැතිතුමන් සහ ඉඩම් හා වාරිමාර්ග ගරු නියෝජ්‍ය අමාත්‍ය අරවින්ද සෙනරත් මැතිතුමා ඇතුළු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හා දේශපාලන නායකත්වයෙන් මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.12.17-වන දින පෙ.ව. 9.00ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ ගරු සම සභාපතිතුමා, නියෝජ්‍ය අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පළාත් පාලන ආයතනවල ගරු නගරාධිපති හා සභාපතිවරුන් ඇතුළු දේශපාලන නායකත්වය හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් තුමා විසින් පිළිගනිමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘතිවල ඉලක්කගත අවසන් ප්‍රගතිය ලගාකරගැනීම සඳහා වර්ෂ අවසානයේ පවත්වන සම්බන්ධීකරණ කමිටුව ඉතාමත් වැදගත් බවත් දෙසැම්බර් අවසානයේ සියළු ව්‍යාපෘති අවසන් වියයුතු බවද සඳහන් කරන ලදි. තවද, දකුණු පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ වසර 30 කට අධික රාජ්‍ය සේවා කාලයේ අවසන් දිනය අද බවත් එතුමා හම්බන්තොට දිස්ත්‍රික් ජනතාව වෙනුවෙන් අවශ්‍ය සෑම අවස්ථාවකදීම උපරිම දායකත්වය දක්වමින් කැපවීමෙන් සේවය ලබාදීම සම්බන්ධයෙන් හා හම්බන්තොට දිස්ත්‍රික්කය වෙනුවෙන් සිදුකරන ලද සේවය අගයමින් දිස්ත්‍රික්කයේ සියළුම දෙනා වෙනුවෙන් ස්තුතිය හා ගෞරවය පුදකරමින් සභාව ඇමතීම සඳහා ප්‍රධාන ලේකම්තුමා වෙත අවස්තාව ලබා දීමෙන් පසු එතුමා විසින් දිස්ත්‍රික්කයේ සංවර්ධනය සඳහා සිදුකරන ලද තම සේවයට නොයෙක් ලෙස සහාය දෙමින්, එක්ව කටයුතු කිරීම පිළිබඳ සැමට ස්තුතිය පළ කරමින් ඉදිරියේදී අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී සහයෝගය ලබාදීමට සූදානම් බව දන්වමින් ඉදිරි සියළු කටයුතු සාර්ථක වේවායි සැමට සුභපැතුම් එක්කරන ලදි.

අනතුරුව, ගරු සම සභාපතිතුමා වෙත රැස්වීමේ ඉදිරිකටයුතු කරගෙන යාම සඳහා ආරාධනා කල අතර ගරු සභාපති තුමා විසින් පැමිණ සිටි සියළුම දෙනා පිළි ගැනීමෙන් පසු ප්‍රථමයෙන්ම, හදිසියේ රෝගාතුරවී මියගිය හිටපු හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති හා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර එම්.කේ.බන්ධුල හරිස්චන්ද්‍ර මැතිතුමා සහ පසුගිය දිනවල සිදුවූ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සිදුවූ ආපදා තත්ත්වය මගින් ජීවිත අහිමි වූ සියළුදෙනා සිහිපත්කරමින් විනාඩියක නිශ්ශබ්ධතාවය රකිමින් ඔවුන් වෙත ගෞරවය පුදකරන ලදි.

2025 වර්ෂයේ දිස්ත්‍රික්කයට වෙන්කරන ලද මුදල් වලින් අපේක්ෂා කරන ප්‍රතිඵල ලගා කරගනිමින් ජාතික අරමුණ සාක්ෂාත් කර ගැනීමට උත්සාහකරන වර්ෂ අවසානය බවත් ඒ සඳහා නිලධාරීන් සියළුදෙනා කටයුතු කරන ලෙසත් පැහැදිළි කරමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට අඛණ්ඩ පැමිණීම අපේක්ෂා කරන බවත් නොවැලැක්විය හැකි හේතුවක් මත පැමිණීමට නොහැකි වේනම්, වගකිවයුතු නිලධාරියෙකු අවශ්‍ය තොරතුරු සමඟ සහ අදාල කරුණු පිළිබඳ පැහැදිළි අවබෝධයකින් යුතුව ඒ සඳහා සහභාගි කරවීමට කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදි.

අනතුරුව, පසුගිය වාර්තාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය යටතේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යෝජනා කරගත් බැදිගම සහ සිටිනාමළුව ප්‍රාදේශිය සෞඛ්‍ය මධ්‍යස්ථාන දෙක සම්බන්ධව වාර්තාවට ඇතුලත් නොවූ බැවින් එකී කරුණ සංශෝධනයක් ලෙස ඇතුලත් කරගැනීමෙන් පසු ප්‍රගතිය සාකච්ඡා කරන ලද අතර රැස්වීම් වාර්තාව සභා සම්මත කර න්‍යාය පත්‍රයට අනුව සභාවේ කටයුතු සිදු කරන ලදි. එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01. | පසුගිය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම. | | | |
| 1.1 | අඟුණකොළපැලැස්ස නගර මධ්‍යය තුළ අඩක් ඉදිකර අතරමඟ නතරකර ඇති වෙළඳ සංකීර්ණය. | මෙම වෙළඳ සංකීර්ණය ඉතිරි වැඩ නිම කිරීමට ඇස්තමේන්තුව ප්‍රධාන කාර්යාලයෙන් සකස්කර ඇති අතර එය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි. | ප්‍රධාන කාර්යාලයත් සමඟ සක්‍රිය සම්බන්ධයක් ගොඩනගාගනිමින් පසුවිපරමකින් යුතුව 2026 වසර අවසන් වීමට පෙර වැඩකටයුතු අවසන් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් දෙන ලදි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය |
| 1.2 | පළමු අදියර යටතේ අත්‍යාවශ්‍ය පාලම් ප්‍රතිසංස්කරණය සඳහා රු.මි 200ක් වෙන් කිරීම. | මේ සඳහා අවශ්‍ය මූලික කටයුතු සියල්ල සිදුකර අවසන් බවත් අමාත්‍යාංශ ලේකම් මගින් භාණ්ඩාගාර ලේකම් වෙත ඉල්ලීමක් සිදුකර ඇති බවත් එකී කරුණු සම්බන්ධව පිළිතුරු ලද විගස කඩිනමින් කටයුතු කල හැකි බව දැනුම් දෙන ලදි. | අදාල කටයුතු කඩිනම් කරන ලෙස පවසන ලදි. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය, තංගල්ල |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.3 | සංවර්ධන ව්‍යාපෘති සඳහා පස් ලබා ගැනීම | මාර්ග සංවර්ධනයේදී මාර්ග උරහිස් පිරවීමටත් අනෙකුත් අවශ්‍ය කටයුතු අත්‍යාවශ්‍ය කාරණයක් බැවින් එකී කටයුතු සිදුකිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ගන්නා ලද තීරණය 2025.12.10 දින පැවති දිස්ත්‍රික් පරිසර කමිටුවේදී අනුමැතිය ලබා දුන් බව දන්වන ලදි.<br><br>එසේම, එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් තවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා පස් රැගෙනයාම සිදුවන හෙයින් ඒ සඳහා දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය අවශ්‍ය බව පැහැදිලි කරන ලදි.<br><br>තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් අක්කර 2ක භූමි ප්‍රමාණයක් වෙන්කර ඇති බවත් මෙකී භූමිය භූවිද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය මඟින් නිර්දේශ වාර්තාව ඇතුළුව ප්‍රාදේශීය සභා ගරු සභාපති තුමා වෙත රාජ්‍ය භාගය ගෙවීම් කර ලබාගන්නා ලෙස දැනුම් දී ඇති බවට වැඩිදුරටත් කරුණු ඉදිරිපත් විය. | පරිසර කමිටු රැස්වීමේ තීරණය පරිදි කටයුතු කරන ලෙසත් පස්, බොරළු ලබාගැනීමට මෙම ස්ථාන හැර වෙනත් ස්ථාන පවතිනම් දැනුම් දෙන ලෙසටත් උපදෙස් දෙන ලදි.<br><br>මෙවැනි අවස්ථාවල දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතියට යොමු කිරීමට උපදෙස් දෙන ලදි.<br><br>අදාල පරිදි රාජ්‍ය භාගය ගෙවීම් කර කඩිනමින් අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දැනුම් දෙන ලදි. | දිස්ත්‍රික්කයේ සියළුම ගරු ප්‍රාදේශීය සභා සභාපතිවරුන් දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>කැනීම් ඉංජිනේරු, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>ගරු සභාපති, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව. |
| 1.4 | වලව ගඟ මෝය ආශ්‍රිතව ජල පාලන ව්‍යාපෘතියක් යෝජනා කිරීම. | වලව ගඟ දෙපස පස් බැමි මඟින් ආරක්ෂිත ක්‍රමවේදයක් අනුගමනය කර ඇති බවත් එකී ක්‍රමය තාක්ෂණිව සුදුසු නොමැති බවත් මේ සම්බන්ධව ප්‍රධාන කාර්යාලය වෙත දැනුම්දී ඇති අතර ප්‍රධාන කාර්යාලයෙන් පැමිණ නිරීක්ෂනයකින් අනතුරුව තීරණ ලබාදිය හැකි බවට කරුණු ඉදිරිපත් විය. | ප්‍රධාන කාර්යාලයත් සමඟ සක්‍රිය සම්බන්ධීකරණයකින් යුතුව නිරීක්ෂණ කටයුතු කඩිනම්කර තීරණ ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ,<br><br>ප්‍රාදේශීය ලේකම්, අම්බලන්තොට. |
| 1.5 | 6 වන (ස්වෙච්ඡා) සන්නද්ධ බුද්ධි බලකා කඳවුර ස්ථානගතව ඇති ඉඩම් කොටස යුද්ධ හමුදාව වෙත විධිමත්ව පවරා ගැනීම | වර්තමානය වනවිට පාසලක අවශ්‍යතාවයක් නොමැති බවත් ප්‍රදේශය ජනාකීර්ණවීමත් සමඟ පාසල ආරම්භ කිරීම සඳහා නැවත කලාප අධ්‍යාපන කාර්යාලය වෙත පැවරීමේ පදනම මත හම්බන්තොට අවට මෙකී බුද්ධි බලකා කඳවුර මඟින් ලබාදෙන සේවා පහසුව සලකා තාවකාලිකව ලබාදීමට එකඟතාවය පලකරන ලදි. | එකඟතාවය මත කටයුතු කරන ලෙස තීරණය කරන ලදි. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට.<br><br>අණදෙන නිලධාරී, යුද්ධ හමුදා කඳවුර, නාගරවැව |
| 1.6 | දකුණු පළාත් රාජ්‍ය නිලධාරීන් ස්ථානමාරු කිරීමේදී මතුවන ගැටලු අවම කර ගැනීම. | පළාත තුළ රාජ්‍ය නිලධාරීන් සඳහා ස්ථානමාරුවීම් ලබාදීමේදී මතුවන ගැටලු අවම කරගැනීම සඳහා මෙ වන විට නිශ්චිත වැඩපිළිවෙලක් සකස් කර දැනුම් දී ඇති අතර කණිෂ්ඨ කාර්යමණ්ඩලය සඳහා පළමු වතාවට මෙම ක්‍රමය අනුගමනය කල බවත් පළාත තුළ සංවර්ධන නිලධාරී අතිරික්තයක් පවතින බවත් පැහැදිලි කරන ලදි.<br><br>හම්බන්තොට දිස්ත්‍රික්කයට පැමිණෙන නිලධරයා නැවත දිස්ත්‍රික්කයෙන් පිටතයට මාරු කරන දිනය දැනගැනීම සඳහා ක්‍රමයක් | එක් එක් සේවාවන්හි ස්ථාන මාරුවීම් සඳහා දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් ස්ථාන මාරුකිරීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සැලැස්ම ක්‍රියාත්මක කිරීම සුදුසු බවට තීරණය කරන ලදි. | ප්‍රධාන ලේකම්, දකුණු පළාත |



විමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | තිබෙනම සහ එකී දිනය නිශ්චිතව සදහන් කිරීමේ හැකියාවක් පවතී නම් මෙකී ගැටළුව සඳහා බොහෝ විසඳුම් ලබාගැනීමේ හැකියාවක් පවතින හෙයින්, ඒ සඳහා ප්‍රතිපත්තිමය, තීරණයක් ගැනීම සුදුසු බවට යෝජනා විය. | | |
| 02. | සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම. | | | |

2.1 මෙම වසර තුළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් 08 ක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා 325 ක් වෙනුවෙන් රු.මි.217 ක ප්‍රතිපාදන ලබාදී ඇති බවත් ඉන් රු.මි. 06කට අදාල ව්‍යාපෘති 02 ක් හැර අනෙක් සියළු ව්‍යාපෘති ක්‍රියාත්මක වන බවත් සඳහන් කරමින් වැඩසටහන් වල 2025.12.15 දිනට අදාල ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කරන ලදි.

**ප්‍රතිපාදන ලැබීම් (රු.මි.) - 2025**

| අ. අ. | සංවර්ධන වැඩසටහන | අනුමත ප්‍රතිපාදන මුදල | අනුමත ප්‍රතිපාදන ගණන | වැඩ අවසන් ව්‍යාපෘති ගණන | ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති ගණන | වියදම | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | විමධ්‍යගත අයවැය වැඩසටහන | 80 | 49 | 49 | - | 66.98 | 100 | 84 |
| 2 | දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන | 83 | 51 | 37 | 13 | 6.2 | 25 | 7.5 |
| 3 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන I | 79.2 | 28 | 22 | 6 | 23.4 | 21 | 30 |
| 4 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන II | 284.19 | 48 | 13 | 33 | - | 69 | - |
| 5 | තිල සෙවන වැඩසටහන | 92.93 | 129 | 112 | 17 | 41.13 | 13 | 44 |
| 6 | සංචාරක වැඩසටහන | 16.99 | 6 | 4 | 2 | 1.91 | 33 | 11 |
| 7 | ග්‍රාමීය සංවර්ධන වැඩසටහන | 70.39 | 5 | 4 | 1 | 3.26 | 20 | 5 |
| 8 | ක්‍රීඩාපිටි සංවර්ධන වැඩසටහන | 22 | 9 | - | - | - | - | - |

මේ අනුව ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ඕකෙවෙල හා හම්බන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස සඳහා අනුමතවූ ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කිරීමට නොහැකිවූ බැවින් එම ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘතිය කඩිනමින් අවසන්කර බිල්පත් ඉදිරිපත් කිරීම කඩිනම් වියයුතු බවටත් කරුණු ඉදිරිපත් කරන ලදි.

එමෙන්ම, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව ව්‍යාපෘති කඩිනම් කිරීමේ අරමුණින් පහත සඳහන් යෝජනා අනුමැතිය සඳහා යොමු කල බවත් ඒවා සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාගැනීම අවශ්‍ය බවත් දන්වන ලදි.

| | | | |
|---|---|---|---|
| | 01. කටුවන ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවේ එකඟතාව යටතේ විමධ්‍යගත අයවැය වැඩසටහනේ ඉතිරි ප්‍රතිපාදන වෙනුවෙන් ඉදිරිපත් කල රු. 140000.00 නව ව්‍යාපෘති යෝජනාව<br>02. මිද්දෙණිය මහාවිද්‍යාලයේ ක්‍රීඩා පිටියේ VAT සඳහා වෙන්කල ප්‍රතිපාදන සංවර්ධන ව්‍යාපෘතියේම ඉතිරි කොටස සඳහා යෙදවීම.<br>03. ඕකෙවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ වැඩසටහන යටතේ හඳුනාගෙන තිබූ රු.මි. 02 ක ව්‍යාපෘතිය පැවති අධික වර්ෂාවත් සමඟ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර එකී මිලියන 02 හි | ඒ අනුව, භෞතික ප්‍රගතිය මෙන්ම මූල්‍ය ප්‍රගතිය ඉහළ නැංවීම සඳහා බිල්පත් ගෙවීම කඩිනම් කරන ලෙස උපදෙස් ලබාදුන් අතර ආවරණ අනුමැතියට යටත්ව ඉදිරිපත් කරනු ලැබූ සියළුම යෝජනා සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |



විමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | ප්‍රතිපාදන මගින් ඕකෙවෙල කොට්ඨාසයේ මීළඟ වසරේ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් සඳහා රු.ලක්ෂ 07 ක් සහ බෙලිඅත්ත කොට්ඨාසය සඳහා රු.ලක්ෂ 10 ක නව ව්‍යාපෘතියක් ලෙස ව්‍යාපෘති දෙකක යෝජනා දෙකක් ක්‍රියාත්මක කිරීමට යෝජනා වීම.<br><br>04. අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිපටන්විල ක්‍රියාත්මක කරනු ලබන සංචාරක ව්‍යාපෘතිය සඳහා දිස්ත්‍රික් ධීවර සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය ව්‍යාපෘතියක් බැවින් එම කමිටුව නොපවැත්වූ හෙයින් ඒ වෙනුවෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ඉල්ලා ඇති බවත් දන්වන ලදී.<br><br>05. ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන දෙවන අධියර යටතේ ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රු.මි. 02 ක සහ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රු.මි. 04 ක යෝජනා දෙකක ප්‍රතිපාදන මෙම වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කල නොහැකි හෙයින් නැවත යොමුකරන ලද බව දැනුම් දෙන ලදී. | ලබා දෙන ලදී.<br><br>මේ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදී. | |
| 2.2 | 2025.12.10 දිනට අනෙකුත් ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසීම | සියළු ව්‍යාපෘති සම්බන්ධව මෙහිදී ප්‍රගතිය විමසීමක් සිදු කරන ලද අතර සියළුම ආයතන මගින් ඉදිරිපත් කරන ලද ප්‍රගතිය ඇමුණුම් අංක 01 යටතේ ඉදිරිපත් කර ඇත. | | |
| 03. | පළාත් සභා සංවර්ධන වැඩසටහන් සම්බන්ධව දැනුවත් කිරීම. | සියළු ව්‍යාපෘති සම්බන්ධව මෙහිදී ප්‍රගතිය විමසීමක් සිදු කරන ලද අතර 2025.11.30 දිනට දැනුම් දෙන ලද ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කර ඇත. | | ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br><br>අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත් සභාව<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් හා මෙහෙයුම් (දකුණු පළාත)<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |

| අමාත්‍යාංශය | අනුමත ප්‍රතිපාදන මුදල රු.මි. | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු.මි. |
| --- | --- | --- | --- | --- | --- |
| ප්‍රධාන අමාත්‍යාංශය | 606.75 | 253 | 180 | 72 | 152.02 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 387.60 | 159 | 82 | 77 | 210.01 |
| ධීවර අමාත්‍යාංශය | 294.21 | 98 | 83 | 15 | 106.52 |
| ක්‍රීඩා අමාත්‍යාංශය | 143.50 | 63 | 32 | 31 | 67.67 |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 464.66 | 90 | 32 | 58 | 193.54 |

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| 04. | සෞඛ්‍ය අංශයෙන් ඉදිරිපත් කරන ලද කරුණු. | බැදිගම සහ සිටිනාමළුව ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංවර්ධන කටයුතු වලදී සිටිනාමළුව ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථානය සති දෙකක් ඇතුළත වැඩ ආරම්භ කල හැකි බවත් බැදිගම ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ කටයුතු සම්බන්ධව තාක්ෂණික නිලධාරී වාර්තාව ලබා ගැනීම සඳහා කටයුතු කරන බවටත් කරුණු ඉදිරිපත් කරන ලදී. | මෙම මධ්‍යස්ථාන 02 ක මේ වසර තුළ ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>ප්‍රාදේශීය ලේකම්, බෙලිඅත්ත සහ වීරකැටිය |

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 05. | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම. | ජාතික ආරක්ෂක සංකල්පයන් සමඟ දිස්ත්‍රික්කයේ ආරක්ෂාව සම්බන්ධව උපරිම සේවාවක් ලබා දෙන බව පැහැදිලි කරන ලදි. | අවශ්‍ය සේවාවන් සක්‍රියව ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදි. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ,තංගල්ල |
| 06. | ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු මඟින් ඉදිරිපත් වූ යෝජනා | | | |
| 6.1 | බුන්දල බැම්මියාව එලංගා පද්ධතියේ පෝෂිත ඇළ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම. | මේ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදී කටයුතු ආරම්භකර ඇති බව දැනුම් දෙන ලදි. | අදාල කටයුතු කඩිනම් කරන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රාදේශිය ලේකම්, හම්බන්තොට |
| 6.2 | මේ වීදිය හා මරේ පාර ආශ්‍රිතව අබලන් වී ඇති ටෙලිකොම් කණු ඉවත් කිරීම. | ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුව සඳහා මේ සම්බන්ධව සාකච්ඡා කිරීමට ටෙලිකොම් ආයතනයෙන් නොපැමිණි හෙයින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කල බවත් ඒ සඳහා ද පැමිණ නොමැති බැවින් සාකච්ඡාකර තීරණයක් ගැනීමට නොහැකි විය. | රැස්වීම සඳහා නොපැමිණීම සම්බන්ධව ලිඛිතව තොරතුරු ලබාගන්නා ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්,<br><br>ප්‍රාදේශිය ලේකම්, හම්බන්තොට |
| 6.3 | ගඟුලන්දෙණිය උපතැපැල් කාර්යාලය සේවා පියස ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කිරීම. | ගඟුලන්දෙණිය උපතැපැල් කාර්යාලය පුද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන බවත් ඒකී ස්ථානයට මහජනතාවට පහසුවෙන් ලගාවීමට නොහැකිවීම සහ ඵලදායී සේවාවක් ඉටුනොවීමත් හේතුවෙන් මෙම කාර්යාලය සේවා පියස ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කිරීම සඳහා යෝජනා කරන බව පැහැදිලි කරන ලදි. | ස්ථාපිත කිරීම සඳහා පවතින පහසුකම් සොයා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රාදේශිය ලේකම්, කටුවන |
| 07. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත්කර විසඳුම් ලබාගැනීමට යොමු කරන ලද ගැටළු | | | |
| 7.1 | මුරුතවෙල ජල යෝජනා ක්‍රමය බැදිගම - මැදගොඩ හරහා වාඩිය ගම්මානයට දීර්ඝ කිරීම. | මෙම ප්‍රදේශයේ ජනතාව ජල ගැටලුව හේතුවෙන් පීඩාවිදින බවත් ඒකී ගැටලු විසදීමට ජලය ප්‍රමාණවත් නොවීම සහ මුරුතවෙල මේ වන විට අගල් 2 ක ජල නල පද්ධතිය වැඩිදියුණු කලයුතු බව ද ඒකී ජල නල පද්ධතිය දීර්ඝ කිරීමටත් යන කරුණු ඇතුලත්ව ජල සම්පත් මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම සඳහා රු.මි. 150 ක් පමණ අවශ්‍යතාවය පවතින බව යන තත්ත්වය මත කෙටිකාලීනව මේ සඳහා පිළිතුරක් ලබාදිය නොහැකි බවට කරුණු ඉදිරිපත් විය.<br><br>එසේම, කර්මාන්තපුරය සඳහා පානීය ජල අවශ්‍යතාවය මුරුතවෙල ජල සම්පත් මධ්‍යස්ථානයෙන් සම්පූර්ණ කල හැකි බවත් කර්මාන්ත අවශ්‍යතාවය සඳහා ඉදිකරණ නළ ළිං දෙක ප්‍රමානවත් නොවන බවට කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව, උඩුකිරිවිල ජලය ඒකී අවශ්‍යතා සඳහා යොදාගැනීමට සුදුසු නම් ලබාදීමට හැකි බවටත් යොජනා කරන ලදි. | මෙ වන විට ජල අවශ්‍යතාවය සපයන ජාතික ප්‍රජා ජල සැපයුම් ක්‍රමය මඟින් හැකි උපරිමයෙන් මෙම ප්‍රදේශයේ ජල අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම සඳහා දායකත්වය ලබා දෙන ලෙස දැනුම් දෙන ලදි.<br><br>ඒ අනුව, සියළු සම්පත් කළමනාකරණය කරගනිමින් සියළු ආයෝජන අවස්ථා මඟහැරීමකින් තොරව ආරම්භ කරන ලෙස හා ගැටළුවක් ඇතිවුවහොත් කඩිනමින් දැනුම් දෙන ලෙසත් උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ<br><br>ප්‍රාදේශිය කළමනාකරු, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br><br>ස්ථානභාර නිලධාරී, ජාතික ප්‍රජා ජල දෙපාර්තමේන්තුව, තංගල්ල.<br><br>දිස්ත්‍රික් අධ්‍යක්ෂ, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය. |



- ඩිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| 7.2 | පළාත් පාලන ආයතනවලට අයත් මාර්ගවල ඉදිකරනු ලබන අනවසර ඉදිකිරීම. | සිකුරාදා දිනයෙන් පටන්ගෙන සති අන්තයේදී අනවසර ඉදිකිරීම සිදු කරන බවත් පොලිසිය දැනුවත් කලද පළාත් පාලන ආයතන ඒ සඳහා නීතිමය කටයුතු සිදු නොවන බවටත් කරුණු ඉදිරිපත් විය. තවද, පළාත් පාලන, පනත් සම්බන්ධව අදාල පොලිස් නිලධාරීන් දැනුවත් කොට මෙකී කටයුතු සිදු නොවන බවට වගබලාගතයුතු බව අවධාරණය විය. | මේ සම්බන්ධව පොලිසියේ අවධානය යොමු කල යුතු බවත් පළාත් සභා හා මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගවල ඉදිකර ඇති අනවසර ඉදිකිරීම පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙසත් තීරණය විය. | සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්<br><br>ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>දිස්ත්‍රික් ඉංජිනේරු , පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |
| 08. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත්වූ යෝජනා | | | |
| 8.1 | CResMPA ව්‍යාපෘති යටතේ සිදුකිරීමට යෝජිත කර්මාන්ත | මෙම ව්‍යාපෘතිය යටතේ තිස්සමහරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත 06 ක් සඳහා අනුමැතිය ඉල්ලා සිටින ලදී. | ඒකී කර්මාන්ත 06 සඳහා අනුමැතිය ලබා දෙන ලදී. | දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ හම්බන්තොට |
| 8.2 | අලි - මිනිස් ගැටුම අවම කිරීමට සහ ග්‍රාමීය ජීවන ආර්ථිකය නගාසිටුවීමට මී මැසි පාලන වැට භාවිතා කිරීම පර්යේෂණාත්මක ව්‍යාපෘතිය සම්බන්ධව දැනුවත් කිරීම. | දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය හා රුහුණු විශ්ව විද්‍යාලය එක්ව අලි මිනිස් ගැටුමට විසඳුමක් ලෙස ගොන්ඔරුව ප්‍රදේශයේ මාස 08 ක පමණ කාලයක් තුළ ක්‍රියාත්මක කරනු ලබන මී මැසි පාලන වැට පර්යේෂණ ව්‍යාපෘතිය පිළිබඳව පැහැදිළි කිරීමක් සිදුකරන ලදි.<br>මෙහි ප්‍රතිඵලයක් ලෙස වන අලින් වගාවන් තුළට ඇතුළුවීම වලකින බවත් එම හේතුව මත ගොවීන්ගේ වගා ආරක්ෂාවීම මෙන්ම, මී පැණි නිෂ්පාදනය ඉහළ නංවා ආදායම වර්ධනය කර ගැනීමේ හැකියාවක් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය.<br>තවද, මෙහි අරමුණ ඉටුකර ගැනීමට සියළු පාර්ශව වල සහාය අවශ්‍ය බවත් පෙන්වා දෙන ලදි. | මේ සම්බන්ධව වෙනම සාකච්ඡාවක් සවිස්තරාත්මකව සිදුකල යුතු බවත් අදාල සියළු පාර්ශව මඟින් මෙම කටයුතු සඳහා සහයෝගය ලබා දෙන ලෙස පවසන ලදි. | සහකාර අධ්‍යක්ෂ(වනජීවී) දකුණ<br><br>සභාපති, දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය |
| 8.3 | කාන්තා හා ළමා සංවර්ධන කමිටුව සඳහා ප්‍රාදේශීය සම්බනස්ධීකරණ කමිටුවේ සභාපති හා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභික ගරු මන්ත්‍රීවරයෙකු සම්බන්ධ කර ගැනීම. | 2025.12.12 වන දින දිස්ත්‍රික් කාන්තා හා ළමා සංවර්ධන කමිටුව දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ බවත් එහිදී අමාත්‍යාංශයීය උපදේශක කාරක සභික ගරු මන්ත්‍රීවරයෙකු ලෙස හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය සාලිය සදරුවන් මදරසිංහ මැතිතුමා සම්බන්ධවී කටයුතු කලබවට කරුණු පැහැදිලි කරන ලදි. | එම සහභාගීත්වය අනුමත කරමින් එම කමිටුවේ ඉදිරි කටයුතු විධිමත්ව සිදුකරන ලෙස දැනුම් දෙන ලදි. | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරි |
| 8.4 | යොමුකර ඇති සීමානිර්ණ කමිටු වාර්තා නැවත සමාලෝචනය කිරීම. | 2012 වර්ෂයේ යොමු කර ඇති සීමානිර්ණ වාර්තාව සඳහා 2021 වර්ෂයේ ඉදිරිපත්කර ඇති නිර්දේශ සලකා බලා විශ්ලේශනයක් කර නිර්ණායක ලබාගතයුතු බවත් මේ සඳහා සුදුසු කණ්ඩායමක් පත්කරගෙන සාකච්ඡාකර වෙනස කුමක්ද යන්න හඳුනාගතයුතු බවත් පැහැදිලි කරන ලදි. | ලබන සතිය තුළ මේ සම්බන්ධව කරුණු වාර්තා කරන ලෙස උපදෙස් දෙන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන)<br><br>සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |

ධම්මි ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 8.5 | මාර්ග අනතුරු අවම කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම. | ප්‍රවාහන, මහාමාර්ග සහ .... අමාත්‍යාංශයිය මගින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් වන අතර විවිධ හේතු පාදක වෙමින් මාර්ග අනතුරු ඇතිවීමේ දැඩි අවධානමක් පවතින හෙයින්,<br>• අනතුරු සහිත සහ අවධානම් සහිත ස්ථාන පිළිබඳ දැනුවත් කිරීමේ පත්‍රිකා බෙදාහැරීම.<br>• ඒම ස්ථාන පිලිබඳ පූර්ව දැනුවත් කිරීමේ පුවරු යෙදීම.<br>• පොලිසිය මගින් වාහන පරීක්ෂා කටයුතුවල යෙදවීම.<br>• පොලිස් මුරපොලවල් ආශ්‍රිත ප්‍රජාවගේ සහයෝගය ලබාගෙන රාත්‍රි කාලවල සංග්‍රහ කටයුතු සූදානම් කිරීම.<br>• අනතුරු අවමකිරීමට වෙනත් සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.<br>යන ක්‍රියාමාර්ග අනුගමනය කරමින් මාර්ග අනතුරු අවම කර ගැනීමට පියවර ගන්නා ලෙස යෝජනා කර ඇත. | මේ සම්බන්ධව සියළු ආයතන ප්‍රධානීන්ගේ සහයෝගය ලබාදෙන ලෙසත් අදාල ආයතන මගින් මෙකී යෝජනාව සම්බන්ධ ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදී. | පළාත් පාලන ආයතන ප්‍රධානීන්<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |
| 09. | සාකච්ඡාකරන ලද වෙනත් කරුණු | | | |
| 9.1 | හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාල සියළුම නගර සඳහා ප්‍රධාන සැලසුම් සකස් කිරීම | එක් වසරකට එක් ප්‍රධාන නගර සංවර්ධන සැලසුමක් ලෙස සකස් කිරීමට පියවර ගෙන ඇති බව හා තංගල්ල නගර සංවර්ධන සැලසුම 2026 වර්ෂයේ අප්‍රේල් මස අවසන් කිරීමට සැලසුම් කර ඇති බවත් පලාත් පාලන ආයතන 12 හි නගර නගර සඳහා (නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රකාශිත බලප්‍රදේශ සඳහා) දළ සංවර්ධන සැලසුම් සකස් කර ඇති බවත් එකී සැලසුම් පාදක කරගනිමින් ප්‍රතිපාදන වෙන්කරගතහැකි බවත් දැනට තංගල්ල සංවර්ධන සැලැස්ම සකස් කිරීම ජයිකා (JAICA) උපදේශන කණ්ඩායමත් සමඟ එක්වී සිදුකරන බව වැඩිදුරටත් පැහැදිළි කරන ලදී. | සියළු සැලසුම් ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුව සඳහා ඉදිරිපත් කරන ලෙසත් මෙම සකස්කරන ලද සැලසුම් ගැසට් නොවීමට මූල්වන හේතු හඳුනාගනිමින් ඉදිරිපත් කරන ලෙස හා මේ වන විට ප්‍රධාන නගර සැලසුම් සකස් කර නිම කර ඇති නගර මොනවාද යන්න හා එකී සැලසුම් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය |
| 9.2 | ලුණුගම්වෙහෙර රෝහල ඇතුළත විෂ මත්ද්‍රව්‍ය පානය කිරීම. | මෙම කරුණ වාර්තාවී සති 5 ක් පමණ ඉක්මගොස් ඇති බවත් මේ සම්බන්ධව පරීක්ෂණ පවත්වන බව හා එහි තීරණ අනුව විනය ක්‍රියාමාර්ග ගන්නා බව පැහැදිලි කරන ලදී. | මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පවත්වා ඊට අදාල තීරණ ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, තංගල්ල |
| 9.3 | 2026 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා ව්‍යාපෘති ඇතුළත් කිරීමට දිස්ත්‍රික් අනුමැතිය ලබා ගැනීම. | 2026 වර්ෂික අයවැය ප්‍රතිපාදන මගින් ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය වෙත වෙන්කර ඇති ප්‍රතිපාදන උපයෝගීකරගනිමින් දිස්ත්‍රික්කය තුළ කාලීනව පැවති අවශ්‍යතාවයන් පදනම් කරගනිමින් හඳුනාගනු ලැබූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ඉල්ලා සිටින ලදී. | මේ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදී. | සහකාර ධීවර අධ්‍යක්ෂ, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව. |

විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 9.4 | කුඩා බිබුල රක්ෂිතයක් ලෙස ගැසට් කිරීම සඳහා දිස්ත්‍රික් අනුමැතිය ලබා ගැනීම. | Clean Sri Lanka වැඩසටහන යටතේ ජල උල්පත් සංවර්ධනය කිරීම මුල්කරගනිමින් වීරකැටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කුඩාබිබුල දකුණ ග්‍රාම නිලධාරී වසමට අයත් කුඩා බිබුල රක්ෂිතය ගැසට් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඇතුලත් වාර්තාව සකස් කර ඇති බවත් ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි. | අනුමැතිය ලබාදුන් අතර නිර්දේශ ඇතුළත් වාර්තාව ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රාදේශිය ලේකම්, වීරකැටිය |
| 9.5 | ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින් දේශගුණික බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන (CResMPA) සඳහා වාරි කර්මාන්ත 02 ක් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. | පසුගිය දිනවලදී ශ්‍රී ලංකාවට බලපෑ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක්වූ වීරවිල යෝජනා ක්‍රමයේ අට්ටික්කාව RB සහ LB ඇළවල් ආපදාවට ලක්වීම හේතුවෙන් නැවත පුනරුත්ථාපනය කිරීමේ අවශ්‍යතාවය මත මෙම ව්‍යාපෘතිය යටතේ එකී කර්මාන්ත දෙක වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කරගැනීමේ හැකියාවක් පවතින හෙයින් ඒ සඳහා අනුමැතිය ඉල්ලා සිටින ලදි. | අනුමැතිය ලබා දෙන ලදි. | වාරිමාර්ග අධ්‍යක්ෂ , හම්බන්තොට |
| 9.6 | දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා 2026 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන සැලැස්ම අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. | දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා 2026 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන සැලැස්ම මුදල් කොමිෂම මඟින් අනුමත කර ඇති බවත් ඒ සඳහා අනුමැතිය ඉල්ලා සිටින ලදි. | මෙම ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව තීරණයක් ලබා දෙන බව දැනුම් දෙන ලදි. | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති), පළාත් |
| 9.7 | වැලි කැණීම් හේතුවෙන් පරිසර හානි සිදුවීම වලක්වා ගැනීම. | අංක 168 - ජංසගම,<br>අංක 163 - වලවවත්ත නැගෙනහිර,<br>අංක 164 - වලවවත්ත බටහිර,<br>අංක 147 - පලුගහගොඩැල්ල,<br>යන ග්‍රාම නිලධාරී වසම් වල නීතිමය ආවරණයක් සහිතව සහ නීති විරෝධී ලෙස සිදුකරනු ලබන වැලි කැණීම හා ඉවත් කිරීම් හේතුවෙන් මෙකී ප්‍රදේශවල පරිසර හානිවීම් සිදුවී මහජන පීඩාකාරී තත්ත්වයන් පැන නැගී ඇති බවත් මෙකී තත්ත්වය වලක්වා ගැනීම සඳහා මෙකී ප්‍රදේශ සංවේදී කළාප ලෙස සලකා කටයුතු කිරීමට නීතිමය පියවර ලබා දෙන ලෙස යෝජනා කර ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br><br>මෙම තත්වය ලුණුගම්වෙහෙර ඇතුළු තවත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන් තුළ පවතින බවද කිරින්ද වැව් ඉවුරු හෑරී ගොස් ඇති බවත් රාත්‍රී කාලයේදී අනවරෙන් වැලි කැණීම සිදුවන බවටද කරුණු | අදාල සියළු ආයතන හැකි සෑම අයුරකින්ම නීතිය ක්‍රියාත්මක කර මෙම පරිසර හානිය අවම කර ගතයුතු බවත් භූ විද්‍යා හා පතල් කාර්යාංශය මඟින් වැලි කැපීම සඳහා දැනට නිකුත් කර ඇති බලපත්‍ර පිළිබඳ තොරතුරු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස අනුව සහ පොලිස් බලප්‍රදේශ අනුව සතියක් ඇතුළත ලබා දෙන ලෙසත් එකී බලපත්‍ර ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවල සමාලෝචනය කරන ලෙසත් උපදෙස් දෙන ලදි. | අදාල සියළුම ප්‍රාදේශිය සභා ගරු සභාපතිවරුන්<br><br>අදාල ප්‍රාදේශිය ලේකම්වරුන්<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි , තංගල්ල<br><br>කැනීම් ඉංජිනේරු, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය |



විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | ඉදිරිපත් විය. අම්බලන්තොට වසර 15 ක් පමණ වන විට සංවර්ධනය නොකලහොත් නායයෑමේ අවධානමක් පවතින බවටද කරුණු ඉදිරිපත් විය. | එසේම, පවතින සංවේදී කලාප හඳුනාගෙන නිර්දේශ වාර්තා සහිව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් දෙන ලදි. | |
| 9.8 | හම්බන්තොට ආයුර්වේද රෝහල, විදුලිබලමණ්ඩලය ආදී ආයතන දක්වා පවතින ප්‍රවාහන ගැටලුව | තිස්සමහරාම සිට මාතර දෙසටත් අම්බලන්තොට සිට තිස්සමහරාම දෙසටත් ගමන් කරන සියඵ මඟී බස්රථ මේ හරහා ගමන් කිරීම නුසුදුසු බවත් ශ්‍රී ලංගම බස්රථ සහ හම්බන්තොට සිට ගොන්ඕරුව දක්වා ගමන් ගන්නා මඟී බස්රථ පැය බාගයක් ඇතුළත සීමාවෙන් පවතින බවට කරුණු ඉදිරිපත් විය.<br><br>කතරගම ඩිපෝව තුළ මේ වන විට රියදුරන්ගේ හිඟය හේතුවෙන් බස් රථ 04 ක් ගාල් කර පවතින බවටද වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරන ලදි. | අත්‍යාවශ්‍ය සේවා අවශ්‍යතා හඳුනාගනිමින් ඒකී සේවා සපයමින් ගැටලුව අවම වන ලෙස ප්‍රවාහන සේවාව ක්‍රමවත්ව කලමනාකරණය කරන ලෙස උපදෙස් දෙන ලදි. | කළමනාකරු,<br>ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,<br>අම්බලන්තොට ඩිපෝව |
| 9.9 | මගී නෞවුකා මගින් පැමිණෙන සංචාරකයින් සඳහා පහසුකම් සැපයීම | මෙකී පහසුකම් සැපයීමේ ස්ථානයක් ස්ථාපිත කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉඩම ස්ථිරව හා ලිඛිතව ලබාදිය නොහැකි බවත් තාවකාලිකව භාවිතා කලහැකි බවත් ඒ අනුව ඒකී සේවා සැපයීම සඳහා බදු පදනමින් අවශ්‍ය දෑ ලබාගනිමින් ඉදිරිකටයුතු කිරීම සඳහා සැලසුම් කර ඇති බවත් දන්වන ලදි.<br><br>තවද, ඉහත සංවර්ධන කටයුතු සඳහා මාර්ග රක්ෂිත සීමාව පමණක් ප්‍රමාණවත් නොවන බැවින් තවත් මීටර් 18 ක පළලින් යුතු ප්‍රමාණයක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට පැවරීමට යෝජිත යාබද ඉඩමෙන් සමාන්තරව ලබාදෙන ලෙස ගරු නගරාධිපති විසින් ඉල්ලා සිටින ලදි. එසේම, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ එකහතාව මත එකී කාර්ය ඉටුකල හැකි බවටද පැහැදිලි කරන ලදි. | අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් ගැටලු මතු නොවන අයුරින් අවශ්‍ය පහසුකම් සැපයීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. | ගරු නගරාධිපති,<br>හම්බන්තොට<br><br>ප්‍රධාන ඉංජිනේරු,<br>මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>ප්‍රාදේශීය ලේකම්,<br>හම්බන්තොට<br><br>කළමනාකාර අධ්‍යක්ෂ,<br>රුහුණු සංචාරක කාර්යාංශය<br><br>අනෙකුත් අදාල ආයතන ප්‍රධානීන් |
| 9.10 | දිස්ත්‍රික්කයේ පවතින ගල්කොරි න්‍යාමනය කිරීම | දිස්ත්‍රික්කයේ පවතින ගල්කොරි සම්බන්ධව අවස්ථා ගණනාවකදී මෙම සම්බන්ධීකරණ කමිටුවලදී සාකච්ඡා වී ඇති බවත් දැනටමත් එක් ගල් කොරියක් සම්බන්ධව ගරු අධිකරණයේ නඩු කටයුත්තක් සිදුවෙමින් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු යෝජනාව වනජීවී අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යැවීමට හා ගල්කොරි වනජීවී කලාපය තුළ පවත්වාගෙනයාම සම්බන්ධව නිරීක්ෂණ | දිස්ත්‍රික් ලේකම්,<br>හම්බන්තොට<br><br>සහකාර අධ්‍යක්ෂ (වනජීවී) දකුණ |



නිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | වනජීවී කලාපය තුළ කිසිදු ගල්කොරියක් පවත්වාගෙනයාමට අවසර ලබා නොදීමටත්, වනජීවී අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව පෙර පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අවසරය මත පවත්වාගෙන ගිය ගල්කොරිවල අවසර කාලය අවසන් වූ පසු දීර්ඝ නොකිරීමට හා ඒ සඳහා වනජීවී අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා නිසි බලධාරියා වන ඔහුගේ අවසරයකින් පමණක් ඉදිරි කටයුතු කිරීමට තීරණය විය. | වාර්තාවක් ලබාගැනීමට තීරණය විය. | |

2025 වර්ෂයට අදාල අරමුණු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය සියළු වැඩ කොටස් ඉතිරිව් පවතින සීමිත කාලය ඵලදායී ලෙස යොදාගෙන ඒකී ඉලක්කගත ප්‍රගතිය අත්කරගැනීම සඳහා සියළුදෙනාගේම සහයෝගය සහ සක්‍රීය දායකත්වය යොමුකරන ලෙසත් දැනුම් දෙමින් සියළුම දෙනාට ලබන්නාවූ නව වර්ෂය සඳහා සුභ පතමින් අද දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීමට සහාය දුන් සියලු දෙනාටම ස්තූතිය පුද කිරීමෙන් අනතුරුව පස්වරු 1.30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

2025 දෙසැම්බර් මස ...24...........
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.



CamScanner

ඇමුණුම -01

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනෙකුත් ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල 2025.12.10 දිනට ප්‍රගතිය (එක් එක් ආයතනය මගින් ලබා දෙන ලද ප්‍රගති වාර්තා මගින් සකස් කර ඇත)

| අ.අ | ආයතනය | ව්‍යාපෘති සංඛ්‍යාව | 2025 වර්ෂයට වෙන්කළ මුදල (රු.මි.) | 2025.12.10 දිනට | | |
|---|---|---|---|---|---|---|
| | | | | ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු. මි. |
| 1 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 5 | 1,780.37 | 4 | 1 | 1,042.00 |
| 2 | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 9 | 127.76 | 7 | 2 | 71.09 |
| 3 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 37 | 98.26 | 4 | 34 | 20.64 |
| 4 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 109 | 262.27 | 44 | 65 | 186.14 |
| 5 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 8 | 34.88 | | 8 | 5.28 |
| 6 | ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා) | 7 | 4.18 | 1 | 6 | 3.98 |
| 7 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 1 | 1.90 | | 1 | 1.90 |
| 8 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය ( නාගරික සංවර්ධන අධිකාරිය) | 1 | 31.16 | 1 | | 6.10 |
| 9 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය (නිවාස සංවර්ධන අධිකාරිය) | 3 | 220.00 | 3 | | 161.72 |
| 10 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | 13 | 54.26 | 9 | 4 | 46.36 |
| 11 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 112 | 846.66 | 18 | 94 | 183.09 |
| 12 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 33 | 103.68 | 16 | 17 | 19.97 |
| 13 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (දකුණු කළාපය) - පරිසර අමාත්‍යාංශය | 23 | 58.63 | 5 | 18 | 14.24 |
| 14 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - පරිසර අමාත්‍යාංශය | 7 | 37.05 | 4 | 3 | 22.64 |
| 15 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - පරිසර | | | | | |
| 16 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව - පරිසර අමාත්‍යාංශය | 16 | 14.5 | 7 | 9 | 6.41 |
| 17 | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය (අන්තර් පළාත්) | 13 | 32.62 | | 13 | 32.62 |
| 18 | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය ( | | | | | |
| | එකතුව | 397 | 3,708.18 | 123 | 275 | 1,824.18 |